www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකයේ එක්සත් ජනපද යුද්ධය හා යටත් කිරීම -- සමාජයක් වැනසීම

*දෙවැනි කොටස*

**The US war and occupation of Iraq – the murder of a society**
**Part 2**

**බිල් වැන් විසිනි**
**2007 මැයි 21**

*මෙය කොටස් තුනකින් යුත් ලිපි මාලාවක දෙවැන්නයි. මෙහි අරමුන දැනට පස් වැනි වසරට එලඹ ඇති එක්සත් ජනපදයේ ඉරාක ආක්‍රමනය මගින් ඇති කර තිබෙන මරනයේ, විනාශයේ හා ප්‍රචන්ඩත්වයේ ඉමහත් පරිමාව ගෙනහැර පාමින් මෑතක පලවූ වාර්තා විමසා බැලීම යි. සියල්ල එකට ගත් විට මෙම වාර්තා මගින් සනාථ කරන්නේ ඉරාකය සෝෂියෝසයිඩ් එනම් හිතාමතා හා ක්‍රමානුකූලව මුලු මහත් සමාජයක් සමූලෝත්පාඨනය කිරීමට සමාන බවයි.*

## ඉරාක ලමුන්ගේ සෝචනීයත්වය

ඉරාක සෞඛ්‍ය අමාත්‍යාංශය ගනන් බලා ඇත්තේ රටේ ලමුන් ගෙන් හරි අඩක් ම කිසියම් ආකාරයක මන්දපෝෂිතයෙන් පෙලෙන බවටයි. යුනිසෙෆ් සංවිධානය මෑතක දී කල අධ්‍යයනයකට අනුව ඉරාකයේ අවුරුදු පහට අඩු ලමුන්ගෙන් සියයට දහයක් උග්‍ර මන්දපෝෂනයෙන් ද තවත් සියයට විස්සක් දුෂ් පෝෂනයෙන් ද පෙලෙයි.

ඉරාකයට ග්‍රීෂ්මය ලඟාවෙමින් තිබිය දී වෛද්‍ය අධිකාරීන් බිය පල කරන්නේ විජලනය, කොලරාව හා විවිධ ආසාදනයන් නිසා ළමා මරන තියුනු ලෙස ඉහල යා හැකි බවට ය. බිඳ වැටී ඇති ඉරාක වෛද්‍ය සේවය එවැන්නක් නතර කිරීමට මුලුමනින්ම අපොහොසත් බවට ද ඔවුන් අනතුරු අඟවති.

එක් ඉරාක මවක් ලමුන්ගේ හා ඔවුන්ගේ පවුල් මුහුනපා ඇති ශෝචනීය තත්වය පැහැදිලි කලේ මෙසේ ය. "පසු ගිය වසරේ දී මාගේ දියනිය හා මව විජලනයෙන් මරුමුවට පත් විය." සාරා මොහොමඩ් නම් 35 වියැති ඇය එක්සත් ජාතීන්ගේ අයිආර්අයිඑන් මාධ්‍ය ආයතනයට ප්‍රකාශ කලේ පසු ගිය මැයි මාසයේ දී සිය පවුලට තම නිවස අතහැර යෑමට සිදු වූ බවයි.

"අපගේ කුඩාරම සිසිල් කිරීමට ක්‍රමයක් නැත. සිව් වසරක් වයසැති මාගේ දියනියට දුෂ්කර ජීවන කොන්දේසිවලට අමතරව අධික ග්‍රීෂ්මයට ඔරොත්තු දිය නොහැකි ය. මාගේ අනෙක් ලමුන් දෙදෙනා දැනට මත් මන්දපෝෂනයෙන් රෝගාතුරව සිටිති. වෛද්‍යවරු මා හට පැවසුවේ මනා සිසිල් කිරීමේ ක්‍රමයකින් හා පානය කල හැකි ජලය නොමැතිව එලඹෙන මාසවල දී බරපතල ප්‍රතිවිපාකවලට මුහුන දීමට සූදානම්ව සිටින ලෙසයි. පිරිසිදු ජලය හා විදුලිබලය නොමැතිව මාගේ තවත් ලමයෙක් අහිමි වුනොත් මටත් සිදුවන්නේ ඔවුන් සමග මියයාමට යි."

බ්‍රිතාන්‍යයේ දිනපතා පුවත්පතක් වන ද ඉන්ඩිපෙන්ඩන්ට් පසු ගිය ජනවාරියේ දී පලකල එක් තක්සේරුවකට අනුව 2003 මාර්තු ආක්‍රමනයෙන් පසුව ලමුන් 260,000ක් පමන මිය ගොස් ඇත.

සිය පස් වැනි උපන්දිනය තෙක් ජීවත් වීමට වාසනාව ලබන ලමුන්ට ඉරාකය සපයා ඇත්තේ සතුරු හා මරනීය වාතාවරනයකි.

ආක්‍රමනයට පෙර සියයට සියයක් වූ පාසැල් යන ලමුන්ගේ ප්‍රමානය දැන් තුනෙන් එකකටත් වඩා අඩු වී ඇත. ලමුන් පන්ති කාමරවලින් ඉවත්ව සිටින ප්‍රධානම කාරනය නිරන්තර සාහසිකත්වය නිසා පාසැල් කරා යන ගමනේ මාරක අවදානම ගැනීමට ඔවුන් ගේ පවුල් අකැමති වීමය.

ඒ සමග ම ඉරාක ලමුන් දස දහස් ගනනක් කෲර ඝාතනවලින් අනාථයන් බවට පත් කර තිබෙන අතර වීදිවල නිදාගන්නා හිඟමන් යදින මොවුන් බැග්ඩෑඩය හා අනෙකුත් ප්‍රධාන නගරවල නව හා ශෝචනීය දර්ශනයක් බවට පත්ව තිබේ. එක්සත් ජාතීන්ගේ මාධ්‍ය ආයතනයේ වාර්තාවලට අනුව " ඉරාකය පුරා දහස් ගනනක් ලමුන් ජීවත් වන්නේ හිඟමනෙන් හෝ හොරකමෙන් හෝ ආහාර සඳහා කසල ගොඩවල් ඇවිස්සීමෙන් ය. සිව් වසරකට පෙර දී නම් මෙකී ලමුන්ගෙන් ඉමහත් බහුතරයක් සිය පවුල් සමග නිවසක ජීවත්වූහ."

ඉරාක ලමුන් මුහුන දී සිටින ශෝචනීය තත්වය, ප්‍රමුඛ බ්‍රිතාන්‍ය වෛද්‍යවරු 100 යුත් කන්ඩායමක් ආක්‍රමනයේ බලපෑම පිලිබඳ සිය දැඩි කනස්සල්ල පල කරමින් ටෝනි බ්ලෙයාර් වෙත විවෘත ලිපියක් යැවීමට

මුල් විය. "වෛද්‍ය පහසුකම් නොමැතිව ඉරාකය තුල ලමුන් මියයමින් සිටීම ගැන අපගේ අවධානය යොමුව තිබේ. සුලු ප්‍රතිකාරකයකින් සුව කල හැකි තුවාල වූ හෝ රෝගී වූ ලමුන් සිය ගනන් මූලික බෙත්හේත් හෝ අනෙකුත් පහසුකම් නොලැබීම නිසා මරනයට අතහැර දමා ඇත. අත්, පාද හා කකුල් අහිමි වූ ලමුන් කෘතීම අංග නොමැතිව සිටිති. දැඩි මානසික කම්පනයන්ට ගොදුරු වූ ලමුන්ට ප්‍රතිකාර කරනු නොලැබේ."

මෙම අවසාන කාරනය එනම් සමස්ත තරුන පරම්පරාවක්ම කම්පනයට පත් කිරීම ඉරාක සමාජය මත වඩාත්ම දුර දිග යන හා ව්‍යසනකාරී ප්‍රතිවිපාක ජනනය කරනු ඇතැයි බියක් පවතී. ඉරාක මනෝ චිකිත්සකයන්ගේ සංගමය ප්‍රකාශ කලේ "පැතිර පවතින අනාරක්ෂිතභාවය නිසා ඉරාක ලමුන් බරපතල ලෙස මානසික පීඩා විඳින" බවයි. පාසැල් ලමුන් දහසක් අතර කල සමීක්ෂනයකින් එය පෙන්වා ඇත්තේ ඉන් සියයට 92ක් ම භ්‍රාන්තිය හා ප්‍රචන්ඩත්වයේ වාතාවරනය මගින් ඇති කල ඉගෙනීමේ අපහසුතාවන්ට ලක්ව සිටින බවයි. එම සංවිධානයේ ප්‍රකාශක මාරූආන් අබ්දුල්ලා වාර්තාකරුවන්ට ප්‍රකාශ කලේ "ඔවුන්ගේ සිත් තුල ඇත්තේ තුවක්කු, වෙඩි උන්ඩ මරනය හා එක්සත් ජනපද ආක්‍රමනිකයා පිලිබඳ භීතියක් පමනක්" බවයි.

ඉරාක ලමුන් වෙත පටවා ඇති මෙම ගොරතර තත්වය යුද අපරාධයක් සේ සැලකෙයි. ආක්‍රමන බලයක් ලෙස එක්සත් ජනපදය ජිනීවා ප්‍රඥප්තිය මගින් පහත සඳහන් දේ සහතික කර දීමට බැඳී සිටියි. වයස අවුරුදු 15ට අඩු ලමුන් ගර්භනී මාතාවන් හා අවුරුදු 7ට අඩු ලමුන් සහිත මව්වරුන් සඳහා ආහාර, වෛද්‍යාධාර හා ආරක්ෂාවට අදාල මනාප පියවරයන් ද ලමුන්ගේ අධ්‍යාපනයට හා සුරක්ෂිතතාවයට කැපවූ සියලු ආයතන පවත්වාගෙන යාමට" බැඳී සිටියි.

## කාන්තාවගේ තත්වයේ ව්‍යසනකාරී පරිහානියක්

එක්සත් ජනපද යුද්ධය හා යටත් කිරීම ඉරාක කාන්තාව පරම්පරා ගනනක් පසු පසට ඇද දමා ඇත්තේ ඔවුන්ගේ නිවෙස් තුල ම පූර්න සිරකරුවන් බවට පත් කර ඇති බිහිසුනු තත්වයන් ද මිලියන ගනනක් දෙවැනි ගනයේ පුරවැසියන් බවට ද පිරිහෙලමිනි.

වාර්තාගත ලෙස ඉහල ට නැගී ඇති ළදරු මරන සමග සමීපව බැඳී ඇති මෙම වර්ධනය ඒ හා සමානව ම සමාජ ප්‍රගමනයේ හෝ අපගමනයේ වැදගත් දර්ශකයක් ද වෙයි. මාක්ස් හා එංගල්ස් විසින් උපුටා දක්වන ලද කොටසක් තුල වසර 155කට පෙර මෙසේ ලියා තැබුවේ ප්‍රන්ස මනෝරාජික සමාජවාදියෙක් වූ චාල්ස් ෆූරියේ ය. "යුගයක වෙනස් වීමට හා සමාජ ප්‍රගමනයේ, නිදහස කරා කාන්තාවගේ ප්‍රගමනය විසින් සනිටුහන් කරන අතර සමාජ පද්ධතියේ දිරාපත් වීම සමග ගෙන එන්නේ කාන්තාව විසින් එතෙක් භුක්ති විඳි නිදහසේ ක්ෂයවීම යි. සියලු සමාජ ප්‍රගමනයේ මූලික මූලධර්ම වනාහී කාන්තාවගේ අයිතීන් පුලුල්වීම යි." ඔහු ලිවී ය.

එක්සත් ජාතීන්ගේ ඉරාකය සඳහා ආධාර මෙහෙවර (යුනාමි) මගින් අප්‍රේල් මාසයේ නිකුත් කල වාර්තාවක රටේ මානව අයිතීන් සටහන් කල සිද්ධීන් 40ක දී තෙමසක කාලයක් තුල එර්බිට්, ඩූහොක්, සුලෙයිමානියා හා සලාහුඩීන් යන ප්‍රාන්ත පාලනයන් හි කාන්තාවන් "ගරු කටයුතු ලෙස ඝාතනය" කර ඇති බව දැක්වේ. "සදාචාර විරෝධී" හැසිරීම් පිලිබඳ චෝදනා මත සමහර අවස්ථාවල පනපිටින් පුලුස්සා දැමීම ද ඇතුලත්ව මෙම ඝාතනයන් සිදු කර ඇත්තේ ඔවුන්ගේ ම පවුල් සාමාජිකයන් විසිනි.

ඉරාක මාධ්‍ය ආයතනයක් වන ඇවේනාහි වාර්තාවක් සඳහන් කලේ මෙම පිලිකුල් සහගත ක්‍රියාවලිය ඊටත් වඩා පැතිරී ඇති බව යි. ඩූහොක් අපරාධ අධිකරනයේ හා ඩක්හොක් අසාඩි රෝහලෙන් ලබාගත් දත්ත මත පදනම් වෙමින් ඇවේනා පද්ධතිය ජනවාරියේ දී වාර්තා කලේ මෙම ප්‍රාන්ත පාලකයන් තුල 2005 දී කාන්තාවන්ට ගිනිතැබීමේ සිද්ධීන් 289ක් දී මරන 46 සිදුව ඇති බවත්, 2006 දී ගිනිතැබීම් 366න් මරන 66ක් සිදුව ඇති බවත් ය. මේ අතර ඉර්බිල් හි හදිසි කලමනාකරන මාධ්‍ය ස්ථානය සඳහන් කලේ එම ප්‍රාන්ත පාලනය තුල 2003 පටන් පුලුස්සා දැමීම් 576කින් මරන 358ක් වාර්තාවී ඇති බවයි.

එක්සත් ජාතීන්ගේ වාර්තාවකට අනුව ඉර්බිල්හි ම 2003 සිට 2006 දක්වා වාර්තා වී ඇති ස්ත්‍රී දූෂන සංඛ්‍යාව සිව් ගුනයකින් ඉහල ගොස් ඇත.

එක්සත් ජනපදයේ පරීක්ෂාව යටතේ කෙටුම්පත් කල ඉරාක ව්‍යවස්ථාව ඉස්ලාම් දහම නිල රාජ්‍ය ආගම ලෙස ප්‍රකාශ කර ඇති අතර "නොවෙනස් කල හැකි ඉස්ලාම් නීතිවලට පටහැනිවන" කිසිදු නීතියක් නොපැනවිය හැකි බව තහවුරු කර තිබේ. මෙම මූලධර්මය දික්කසාද, පවුලේ දේපල හා ලමුන් ගේ භාරකාරීත්වයට බලපාන ඉරාකයේ වඩාත් ලිබරල් සිවිල් නීති අහෝසි කිරීමට මග පාදන අතර ඒ වෙනුවට කාන්තාව හෝ බොහෝ අයිතීන් පිලිකෙව් කරන ෂාරියා නීතිය ආදේශ කෙරේ.

දැනටමත් මෙම මූලධර්මයන් ඉස්ලාමීය පක්ෂවලට අයත් සන්නද්ධ භටයන් විසින් වීදිවල දී ක්‍රියාවට නගනු ලබන අතර මහාචාර්යවරු, වෛද්‍යවරු වැනි වෘත්තීය තනතුරු ඉසිලීමට හෝ ව්‍යාපාරවල මෙහෙයුම් ක්‍රියා කලාපයක් ඉටු කිරීමට තරම් එඩිතරවන

කාන්තාවන් මරාදමා තිබේ. මේ පිලිබඳව සෝදිසියෙන් සිටින්නවුන් සාහසිකත්වයේ පිටුබලය සහිතව හිජාබ් හෝ මුහුනු ආවරන වන ඉස්ලාම් ඇඳුම් ඇඳීමට බල කරති. සමහර ප්‍රදේශවල දී එවන් කන්ඩායම් මධ්‍යාහ්නයෙන් පසුව කාන්තාවන් සිය නිවෙස්වලින් පිට නොයායුතු බවටත් වාහන නොපැදවිය යුතු බවටත්, පිරිමි ඥාතියෙකු සමග හැර පිටත නොහැසිරිය යුතු බවටත් බල කරනු ලැබේ.

එක්සත් ජනපද ආක්‍රමනයේ සිව්වෙනි සංවත්සරය නිමිත්තෙන් ඉරාකයේ කාන්තා විමුක්තිය නම් සංවිධානය. විසින් නිකුත් කල වාර්තාවකින් ප්‍රකාශකලේ "ආක්‍රමනයේ පසු ගිය සිව් වසර තුල ඉරාක කාන්තාව 20 වැනි සියවසේ භුක්ති විඳි වරප්‍රසාද හා දිනාගත් දේ ක්‍රමයෙන් අහිමි කර ගනිමින් සිටිති. සමාජ විෂය ක්ෂේත්‍රයෙන් කාන්තාව මකා දැමීම සඳහා නූතන රාජ්‍යයක සිට ඉරාකය, සමාජ විෂය ක්ෂේත්‍රයෙන් කාන්තාව මකා දැමීම සඳහා උනුන් අතර කා කොටාගන්නා ඉස්ලාමීය හා වාර්ගික යුද දෙටුවන්ගේ බෙදී ගිය රටක් බවට පත්ව තිබේ. මිලියන ගනන් කාන්තාවගේ ඉරනම විනාශකාරී එක්සත් ජනපද යුද යන්ත්‍රය හා කිසිදු ධෛර්යයකින් හෝ වටිනාකමකින් තොර අසරන අඳුරු වස්තූන් බවට කාන්තාව පත් කර තිබෙන විවිධ වර්ගවල ඉස්ලාමීය පාලනයන් අතර නාස්ති වී තිබේ."

නිකායවාදී යුද ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස වෙනත් නිකායන්හි සන්නද්ධ භටයන් විසින් කාන්තාවන්ට පහරදීම ද, කාන්තා රැඳවියන් සමූහ ලෙස දූෂනය කිරීම ද ඇතුලු කාන්තාවන්ට එරෙහි ප්‍රචන්ඩත්වය වැඩි වෙමින් තිබෙන බව වාර්තා සඳහන් කරයි. කාන්තාවන් පැහැරගෙන යාම ද බහුලව සිදු වෙයි. පසු ගිය වසරේ මාර්තුවල මෙම කන්ඩායම විසින් නිකුත් කල වාර්තාවකට අනුව සදාම් හුසේන් තන්ත්‍රය යටතේ කිසිවිටෙක අසන්නට නොලැබුනු ආකාරයේ ප්‍රචන්ඩත්වයට ගොදුරු වූ කාන්තාවන් 2000ක් පිලිබඳව සිදු වීම් එක්සත් ජනපද ආක්‍රමනයේ පලමු වසර තුල වාර්තාවී තිබේ. මින් බොහෝ දෙනෙක් දූෂනයට හෝ වධ බන්ධනවලට ලක් ව තිබේ. එවන් සිදු වීම් ද සමග වෙනත් ආකාරයේ ප්‍රචන්ඩත්වය පසු ගිය වසර පුරා සැලකිය යුතු තරමින් පැතිරීගොස් තිබේ.

ඉරාකයේ එල්ලා මැරීම සඳහා වූ පෝලිමේ කාන්තාවන් සිව් දෙනෙක් ද වන අතර දෙදෙනෙක් සිර කර ඇත්තේ ඔවුන්ගේ තරුන ලමුන් ද සමග ය.

## ඉරාකයේ සුලුජාතීන් සමුලෝත්පාඨනය

ඉරාක සමාජය කඩාකප්පල් වීමේ තව ද එක් සලකුනක් වන්නේ සුලුජාතීන්ගේ තත්වයයි. සුලුජාතීන්ගේ අයිතීන් පිලිබඳ ජාත්‍යන්තර කන්ඩායම විසින් මෙම මාසයේ පල කල වාර්තාවකින් අනාතුරු අඟවා ඇත්තේ ඉරාකයේ සුලු ජාතික කොටස් ක්‍රමානුකූලව සමූලඝාතනය කෙරෙන බවයි. එය ඉරාකය වර්ග කර ඇත්තේ සුලු ජාතීන්ට එල්ල කෙරෙන තර්ජන සම්බන්ධයෙන් ගත් විට එය ලෝකයේ නරකම රටවලින් දෙවැන්න ලෙසට ය. එය සෝමාලියාවට පමනක් දෙවැනි වන අතර (සුඩානයේ ) ඩාෆූර්වලට වඩා අන්ත ය.

"2003 වසරේ පටන් ඉරාකයේ සුලු ජාතීන්ගේ වාර්ගික සම්මිශ්‍රනය, පලායාම හා සමූලෝත්පාඨනය" යන හිසින් යුත් වාර්තාව එරටෙහි ආමේනියානුන්, චැල්ඩෝඇසිරියන් ක්‍රිස්තියානුවන්, බායි, ෆයිලි කුර්දිවරුන්, යුදෙව්වන්, මැන්ඩේඉන්වරු, පලස්තීනුවන්, ෂබාක්වරු, ටර්කෝමන්වරු, හා යාසිඩිස්වරු යන රටේ මුලු ජනගහනයෙන් සියයට දහයක් වන ජන කොටස මුහුන පාන තත්වය සොයාබලා ඇත.

යාසිඩිස්වරු, මැන්ඩේඉන්වරු හා ක්‍රිස්තියානුවන් ද ඇතුලත් සුලු ජන කන්ඩායම්වල මිනිසුන් ඉලක්ක කර ගත් ඝාතනයන් ඉරාකය අත් විඳිමින් සිටියි. ඉරාකයේ අනෙකුත් සුලු ජන කොටස් දිනපතා සිදුවන භීෂනය, වධබන්ධන, හා දේශපාලන සම්මිශ්‍රනට මුහුන දී සිටින අතර එය තුඩුදී ඇත්තේ මෙම ජන වර්ගයන් රටෙන් පලායාමට ය. පසු ගිය වසරේ දී ඉරාකය ලෝකයේ නරක ම රට ලෙස වර්ග කොට තිබේ. ලෝකයේ දෙවැනි නරකම තැනට එරට පත් වීම පෙන්නුම් කරන්නේ එක්සත් ජනපදය ක්‍රියාවට නැගූ මැදිහත්වීම පැතිර පවතින ප්‍රචන්ඩත්වය මුදාහැර ඇති සෝමාලියාවේ තත්වය සැලකියයුතු තරම් පිරීහීමට පත්ව තිබීම යි.

ඉරාකයේ සමහර සුලු ජන වර්ගයන් ඉපැරනි මෙසපොතේමියාව තරම් ඈත කාලයක සිට රට තුල ජීවත්ව සිටීමේ හේතුවෙන් අරාබීන් ලෙස කාලයක පටන් හඳුන්වයි.

භීෂනයේ හා අඩම්තේට්ටම් කිරීමේ ගොදුරු බවට පත්ව සිටින ඔවුන් දැන් ඉරාකයෙන් අතුරුදහන් වෙමින් සිටිති. බොහෝදෙනෙක් ඝාතනය කොට ඇති අතර ඉතිරි අය විදේශවලට පලා යමින් සිටිති.

මෙම ව්‍යසනය පිලිබඳ වාර්තාවේ කතුවරුන් දෝෂාරෝපන කරන්නේ එක්සත් ජනපද මිලිටරි යටත් කිරීමට ය. "2003 ඉරාකය වාඩිලෑමෙන් පසුව, නිකායික හා වාර්ගික රේඛා ඔස්සේ දැඩි ලෙස පංගු කරනු ලැබූ සාමාජිකත්වයක් සහිත පාලක සභාවක් සභාග බලධාරීන් විසින් පිහිටුවනු ලැබුනි. දේශපාලන එකඟතාවය සහතික කර ගැනීමේ දී මුලුමහත් අමාත්‍යංශ තුල ම අධිකාරය දැරුවේ අදාල

ඇමතිවරයාගේ නිකායට අයත් කන්ඩායම් විසිනි. ඉක්මනින්ම නව ඉරාක රාජ්‍යයේ නිර්නායකය බවට පත් වූයේ නිකායික දේශපාලනයයි."

## ඉරාකයේ වෛද්‍ය වෘත්තිකයන් වැනසීම

ඉරාකයේ මිනීමරු ප්‍රචන්ඩත්වය හා අනාථන්ගේ පලායාම හේතු කොට ගෙන සමාජ පැවැත්මේ අවියෝජනීය අංගයක් වන ප්‍රධාන වෘත්තීන් ඉහල සිට පහලට වැනසී ගොස් ඇත.

මෙඩැක්ට් නම් බ්‍රිතාන්‍ය රාජ්‍ය නොවන සංවිධානය ඉරාක වෛද්‍ය සංගමයේ නිල සංඛ්‍යා උපුටා දක්වමින් පසු ගිය වසරේ මාර්තුවේ දී වාර්තා කලේ ඉරාකයේ 34,000ක් වූ වෛද්‍යවරුන්ගෙන් 18,000ක් රට හැර ගොස් ඇති බවයි. තවත් 2,000ක් ඝාතනය කර ඇති අතර 250ක් වත් පැහැරගෙන ගොස් ඇත.

ඉරාක සරනාගතයන්ගේ නික්ම යෑම පිලිබඳව මැයි 13 වන දින නිව් යෝර්ක් ටයිම්ස් සඟරාවේ පල කල ලිපියකින් නීල් රොසන් එවන් වෛද්‍යවරයෙක් සමග සාකච්ඡා කරයි. පවුල් සෞඛ්‍ය විශේෂඥවරියක් වන ඇය සිය දරුවන් පස්දෙනා ද සමග ඩැමස්කස් වෙත පලා ගොස් තිබේ.

උගුර පිලිබඳ ශල්‍ය වෛද්‍යවරයෙක් හා වෛද්‍ය විද්‍යාලයේ මහාචාර්යවරයෙකු වූ ඇයගේ සැමියා සන්නද්ධ මිනිසුන් විසින් මෝටර් රියෙන් ඉවතට ඇද පැහැරගෙන ගොස් පසුව ඝාතනය කර තිබී සොයාගැනීමෙන් පසුව ඇය රට හැර ගියාය. මේ පිලිබඳව පරීක්ෂන පවත්වන ලෙස ඉරාක පොලීසියෙන් ඉල්ලා සිටි විට ඔවුන් කීවේ "ඔහු උපාධිධාරියෙක් හා වෛද්‍යවරයෙකි. ඔහු සුන්නි මුස්ලිම්වරයෙකි. එබැවින් ඔහුට ඉරාකයේ රැඳී සිටිය නොහැක." යනුවෙන් බව ඇය රොසන්ට ප්‍රකාශ කලා ය. "ඔහු මරා දැමුවේ එම නිසා ය." පොලිසියත් සෞඛ්‍ය අමාත්‍යාංශයත් යන දෙකම පාලනය කරන්නේ ෂියා මුස්ලිම් කොටස් විසිනි. පසුව ලිපියකින් ඇයට දන්වා ඇත්තේ ප්‍රදේශය අතහැර යන ලෙසයි.

ජනතා විපත් නිසා ඇතිවන ඉමහත් බාධක ද අත්‍යාවශ්‍ය සැපයුම්වල හිඟයද සමග එක්ව ගත් කල පුහුනු වෛද්‍ය කාර්ය මන්ඩලයක හිඟය, ඉරාකයේ සෞඛ්‍ය සේවා පද්ධතිය සුනු විසුනු කර තිබේ.

පසු ගිය ඔක්තෝබරයේ දී බ්‍රිටිෂ් මෙඩිකල් ජර්නල්හි පල වූ ලිපියකට අනුව ඉරාකයේ දිවානියා වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍යවරුන් තිදෙනෙකු ගනන් බලා ඇත්තේ 2003 එක්සත් ජනපද ආක්‍රමනයේ පටන් මිය ගිය ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගෙන් අඩක ගේ මත් ජීවිත නිසි වෛද්‍ය ප්‍රතිකාර ලැබිය හැකි වූයේ නම් බේරා ගත හැකිව තිබුනු බවටයි.

"යථාර්ථය නම් බොහෝදෙනෙකුට ප්‍රතිකාර ලබාදීමට අපට නොහැකි වීමයි. හදිසි වෛද්‍ය දෙපාර්තමේන්තුවලට යොදවා ඇත්තේ හදිසි ප්‍රතිකාර කිරීමේ හොඳ පුහුනුවක් හෝ දක්ෂතාවක් නොමැති වෛද්‍යවරුන් ය. පුහුනු හා නිපුන කාර්ය මන්ඩලයක් සිටියේ නම් මියගියවුන්ගෙන් අඩකටත් වැඩි සංඛ්‍යාවක් බේරා ගත හැකිව තිබූ බව වෛද්‍ය සේවකයන් පැවසූහ"යි ඔවුන් ප්‍රකාශ කලහ. වාර්තාව තව දුරටත් සඳහන් කලේ "අපගේ නිපුනතාවයෙන් අපට උගන්වා ඇත්තේ ව්‍යසනයටත් වඩා විනාශකාරී වන්නේ හදිසි වෛද්‍ය සේවයේ දුබලතාවය බවයි. එහෙත් ඉරාකය තලා දමන්නා වූ දෛනික ප්‍රචන්ඩත්වය හමුවේ ජාත්‍යන්තර වෛද්‍ය ප්‍රජාව ඔහේ බලා සිටියාට වැඩි යමක් කලේ නැත." යනුවෙනි.

ඒ හුදෙක් ජාත්‍යන්තර වෛද්‍ය ප්‍රජාව පමනක් නොවේ. ඉරාක වෛද්‍ය සේවා පද්ධතියේ තත්වය එක්සත් ජනපද යුද අපරාධයකට සමාන වේ. සිව්වැනි ජිනීවා ප්‍රඥප්තිය කියා සිටින්නේ ආක්‍රමනකාරී බලයක් "මනුෂ්‍ය ආශ්‍රයෙන් බෝවෙන රෝග හා වසංගත වැලැක්වීමට විශේෂ අවධානයක් යොමු කරන ආරෝග්‍යශාලා හා මහජන සෞඛ්‍ය වැඩසටහන් ඇතුලත් ක්‍රමවත් වෛද්‍ය සේවාවක් පවත්වා ගැනීම සහතික කල යුතු අතර වෛද්‍ය සේවකයන්ට ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමට ඉඩ සැලසිය යුතුය."

ජිනීවා ප්‍රඥප්තීන් අනුව, වාඩිලාගත් බලයක් විසින් ආරෝග්‍යශාලාවල අපක්ෂපාතිත්වය ද, ප්‍රහාරයන්ගෙන් ඒවා ආරක්ෂා කිරීම හා වෛද්‍ය ප්‍රතිකාර බලාපොරොත්තු වන සියල්ලන්ට එය සහතික කර දීමද අවශ්‍යතාවයකි. එහෙත් එක්සත් ජනපද ආක්‍රමනික හමුදා නිරන්තරයෙන් රෝහල්වලට පහර දෙති. තවද සන්නද්ධ භටයන්ට වෛද්‍ය ආයතනවල නිදහසේ හැසිරීමටත් වෙනත් නිකායන්ට අයත් වූවන් ඉවතට ඇද ඝාතනය කිරීමටත් අවස්ථාව සලසා තිබේ.

වෛද්‍යවරුන් පැහැරගෙන යෑම හා ඝාතනය කිරීම හා ඔවුන් රටින් පලායාම ඉරාකයේ අනෙකුත් සියලු වෘත්තීන්ට ම පාහේ පොදු සන්සිද්ධියක්ව ඇත. වොෂින්ටන් බෲකින්ස් ආයතනය විසින් පවත්වාගෙන යන ඉරාක දර්ශකය ගනන් බලා ඇත්තේ ඉරාකයේ " වෘත්තීයමය පන්තිය" එනම් වෛද්‍යවරු, මහාචාර්යවරු ඖෂධවේදීන් හා වෙනත් විශ්වවිද්‍යාලවලින් පුහුනුවලත් අයගෙන් සියයට 40ක් 2003 වසරේ පටන් රට හැර ගොස් තිබෙන බවයි.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org